රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2020
---------------------------------------------

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
-----------------------------------------------------------------

මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ දක්ෂිණ අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් නව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුළින් රටේ උපායමාර්ගික හා සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ආසන්න වශයෙන් රු.මිලියන 286,000ක් වන අතර භාණ්ඩාගාර ලේකම්ගේ අධීක්ෂණය යටතේ දේශීය බැංකු පද්ධතියෙන් මූල්‍යයනය කිරීමට තීරණය කර තිබුණි.

1.3 මතය
------

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම
-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම
-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2 භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

**2016 අගෝස්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට පැල්මඩුල්ල දක්වා කිලෝමීටර් 73.9ක් ඉදිකිරීම 2016 දී ආරම්භ කරන ලද මූලික කටයුතු වර්ෂ 04 පසුව 2020 ජූලි 01 දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල නව තීරණ මගින් අවලංගු වී තිබුණි. කෙසේවෙතත්, මුළු මාර්ගයේ දිගින් කහතුඩුවේ සිට ඉංගිරිය දක්වා කොටසේ කිලෝමීටර 24.3ක ඉදිකිරීම් සඳහා පමණක් 2021 මැයි 03 දින පිරිනමා තිබුණි. කහතුඩුව අන්තර් හුවමාරුවේ කිලෝමීටර 02 සහ ඉංගිරිය සිට පැල්මඩුල්ල කොටසේ කිලෝමීටර 47.6ක මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.**

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ලැබී තිබුණු තොරතුරු අනුව, කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට ඉංගිරිය දක්වා රුවන්පුර මාර්ගයේ අදියර I කිලෝමීටර 24.3ක ඉදිකිරීම් ලංසුකරුවන් කැඳවීමේ අරමුණ සඳහා වෙනම කොන්ත්‍රාත් පැකේජ 04 බෙදා තිබුණු අතර ලංසු | ලංසු කොන්ද්සි කපා හැරීමේ අරමුණින් වෙනම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර කොන්ත්‍රාත් පැකේජ 04 එක් ඉදිකිරීම් සමාගමක් වෙත පිරිනමා තිබුණි. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.3.20 වගන්තිය පරිදි ඇගයීම් අදියරේදී හෙළිදරව් කරන ලද නිර්ණායක වෙනස් නොකළ යුතු හෝ අමතර |

| | | |
|---|---|---|
| ලියවිල්ලේ 3 වගන්තිය දක්වා ඇති ලංසු කොන්දේසි අනුව ලංසුකරුවකු වෙත එක් කොන්ත්‍රාත්තුවක් පමණක් පිරිනමා තිබුණි. කෙසේවෙතත්, අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව ඉහත ලංසු කොන්දේසි කපා හැරීමට තීරණය කළ තිබුණු අතර සෑම පැකේජයකම අඩු පිරිවැය සලකමින් මුළු කොන්ත්‍රාත් පැකේජ 04 එක ඉදිකිරීම් සමාගමක් වෙත පිරිනමා තිබුණි. ඒ අනුව, 2020 ජුනි 23 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 2.1.3 වගන්තිය මගින් අපේක්ෂා කළ අරමුණ සාර්ථක වී නොතිබුණි. | | නිර්ණායක හඳුන්වා නොදිය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව වෙත කොන්ත්‍රාත් ගිවිසුමකින් තොරව රු. මිලියන 8.6ක අත්තිකාරමක් ගෙවා තිබුණද, අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා විස්තරාත්මක ජල විද්‍යා අධ්‍යයනය සඳහා කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. | අධිවේගී මාර්ගයේ ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා දත්ත එකතු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දැනටමත් ගෙවා ඇති අත්තිකාරම් මුදල (රු. 8,593,398.00) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් සිදු කරන අදියර 02 සහ අදියර 03 විස්තරාත්මක ජල විද්‍යා අධ්‍යයනය මගින් නිරවුල් කරනු ලැබේ. | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් අත්තිකාරම් මුදල රු.8,593,398 සඳහා සනාථන ලබා ගැනිමට සහ නැවත අයකර ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඇ) 2020 ජූලි 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍ය පහසුකම් රටේ දේශීය බැංකු මගින් සලසා ගත යුතුය. අධිවේගී මාර්ගය සඳහා කොන්ත්‍රාත්තුව 2021 මැයි 03 දින පිරිනමා තිබුණද, ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් 2021 ජූලි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත් පිරිනමන ලද දිනය 2021 මැයි 03 ලෙස වෙනස් කළ යුතුය. ව්‍යාපෘතිය සඳහා රු.බිලියන 3.25ක ණය පහසුකම ජාතික ඉතිරි කිරීමේ බැංකුව 2021 ජූලි 16 දින ලබාදී තිබුණු අතර අත්තිකාරම් ලෙස රු.බිලියන 3.20ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. 2022 වර්ෂයේ වියදම් සඳහා (රු.බිලියන 12.95) ලංකා බැංකුව මගින් ණය පහසුකම් ලබා ගැනීමට සැලසුම් කර තිබුණි. | ඉලක්කගත දිනට අධිවේගී මාර්ගයේ නිම කිරීමට දේශීය බැංකු තුළින් රු. බිලියන 54ක මුළු මූල්‍ය අවශ්‍යතාවය සැලසුම් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

**2.3** පාරිසරික ගැටලු පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, පාරිසරික ගැටලු කිහිපයක් හේතුවෙන් ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා කිලෝමීටර 47.6ක මාර්ග කොටසට අදාළ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව (EIA) මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2021 ජුනි 30 දින වන විටත් ලබා දී නොතිබුණි. එම නිසා ව්‍යාපෘතිය මුළු උමගේ දිග අඩු කිරීමට මංතීරුවල ආරම්භක සක්‍යතා අධ්‍යයනය නැවත සලකා බැලීමට තීරණය කර තිබුණු අතර ස්වභාවික උවදුරු අවම කිරීමට සහ අධිවේගී මාර්ගය සඳහා නව මාර්ගයක් සෙවීමට තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2016 දී දරන ලද රු. මිලියන 394ක ආරම්භක සක්‍යතා අධ්‍යයන පිරිවැයට අමතරව ව්‍යාපෘතිය විසින් එකතුව රු. මිලියන 6.84ක් දරා තිබුණි. | පිළිගනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා කිලෝමීටර 47.6ක ඉතිරි මාර්ග කොටස සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව ලබා ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

**2.4** ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, කහතුඩුව සිට ඉංගිරිය දක්වා මාර්ග කොටසේ රජයේ ඉඩම් කොටස් 415ක් ඇතුළුව ව්‍යාපෘතිය විසින් අත් කර ගත යුතු මුළු ඉඩම් කොටස් ප්‍රමාණය 2,597ක් විය. 2017-2018 වර්ෂයේදී ඉඩම් කොටස් 1,933 ක් සඳහා 38 (ආ) වගන්තිය ගැසට් කර තිබුණද, 2021 ජුනි 30 දින වන විටත් කිසිදු ඉඩම් කොටසක් සඳහා වන්දි ගෙවා නොතිබුණි. එම නිසා කොන්ත්‍රාත් කොන්දේසි වෙළුම II අනුව, කොන්ත්‍රාත්කරු වෙත වැඩබිමේ අයිතිය පැවරීමට නොහැකි වී තිබුණි. | වර්තමානයේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය පහත දක්වා ඇත. 38 (ආ) ගැසට් කරන ලද මුළුකොටස් 2,060 වන්දි ගෙවන ලද කොටස් 35 ගෙවන ලද වන්දි මුදලරු. මිලියන 141.79 කොන්ත්‍රාත්කරු වෙත අයිතිය පවරන ලද කොටස් ගණන 1,511 | ඉලක්කගත දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට අවශ්‍ය වේ. |

**2.5** මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය නිලධාරීන් 37 ක් විය. කෙසේවෙතත්, පුරප්පාඩු 19 ක් පැවති අතර එම පුරප්පාඩුවලින් 13 ක් ව්‍යාපෘතියේ මෙහෙයුම් මට්ටමේ පැවතුණි. | ව්‍යාපෘතියේ කටයුතුවල ප්‍රගතිය සමග ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාව මත බඳවා ගැනීම් සිදු කර ඇත. වර්තමානයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ අනුමත කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 28 දෙනෙකු සේවයේ යෙදී සිටී. | ප්‍රමාදයකින් තොරව නියමිත කාලයට කටයුතු සිදු කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීමට සහ ඉලක්කගත දිනට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගැනීම අවශ්‍ය වේ. |